Learning Resource Center
R
De Mazenod College
Kandana

ද මැසිනොද් විදුහල කඳාන

De Mazenod College - Kandana

# ඉතිහාසය - I කොටස

12 ශ්‍රේණිය

28. 11. 2016

නම ............................................................ පන්තිය .................. කාලය: පැය 3යි

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න

පහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු 5 බැගින් දී ඇත. ඒවා අතරින් නොගැළපෙන පිළිතුර තෝරන්න

1. 1. ඉන්ඩිකා 2. රාමායනය 3. මහාභාරතය
   4. අර්ථශාස්ත්‍ර 5. යාල්පානවෛපවමාලෙයි (-----)

2. 1 දේවතාකොටුව 2 කලිගුබැම්ම 3 වාහල්කඩ
   4 මුරගල 5 කොරවක්ගල (-----)

3. 1 දීඝගාම 2 මාගම 3 විජි තගාම
   4 උරුවෙලගාම 5 රෝහණගාම (-----)

4. 1 අභයගිරිය 2 මහාවිහාරය 3 දඹකොලවිහාරය
   4 ථූපාරාමය 5 මහාපාලි දානශාලාව (-----)

5. මහාවංස රචනාවීමට පෙර බිහිවූ වංසකතාවක් වන්නේ

1 දීපවංසය 2 ධාතුවංසය 3 බෝධිවංසය
4 චූලවංසය 5 ථූපවංසය (-----)

6 මහාවංසයේ දෙවන කොටස තුල වඩාත් වැදගත් රජු වන්නේ

1 දේවානම්පියතිස්ස රජු 2 මහසෙන් රජු
3 දුටුගැමුණු රජු 4 ධාතුසේන රජු
5 පලමු පරාක්‍රමබාහු රජු (-----)

7 වසභ රජුගේ රාජ්‍ය කාලය පිළිබඳව තොරතුරු හෙළිකරන ලිපියක් වන්නේ

1 කලුදියපොකුණ ලිපිය 2 සංගමු විහාර ලිපිය
3 වල්ලිපුරම් සන්නස 4 මිහින්තලා ලිපිය
5 සංඛපාල ලිපිය (-----)

8 සංඝමිත්තා තෙරණිය මෙරටට පැමිණීමේදී භාවිතා කල වරාය වන්නේ

1 ගොඩවාය 2 කාලතිත්ථ 3 දඹකොලපටුන
4 මහාතිත්ථ 5 සුප්පාරක (-----)

9 පණ්ඩුකාභය රජුගේ ගුරුවරයා වූයේ

1 චන්ද්‍ර බ්‍රාහ්මණයා 2 තිවක්ක බ්‍රාහ්මණයා
3 තිය බ්‍රාහ්මණයා 4 පණ්ඩුල බ්‍රාහ්මණයා
5 චිත්තරාජ (-----)

10 අනුරාධපුර නගරය ගොඩනංවන ලද්දේ

1 දේවානම්පියතිස්ස රජුය 2 පණ්ඩුකාභය රජුය
3 පඬුවස්දෙව් රජුය 4 විජය රජුය
5 දුටුගැමුණු රජුය (-----)

11 මහින්දාගමනයත් සමගම බුදුදහම ලංකාවේ සීඝ්‍රයෙන් ව්‍යාප්තවීමට බලපෑ හේතු වන්නේ

1 දේවානම්පියතිස්ස රජු බුදුදහමට රාජ්‍ය අනුග්‍රහය ලබාදීම
2 එකල ලංකාවේ තිබූ අනෙකුත් ආගම් සංවිධානාත්මක නොවීම
3 එකල මෙරට පැවති වන්දනා ක්‍රම දුර්වල වීම
4 මෞර්ය අධිරාජ්‍යයේ බලපෑම
5 බුදුරජාණනවහන්සේ මෙරටට තෙවරක් වැඩමකර තිතීම (-----)

12 ලංකාවේ ප්‍රාග් ඓතිහාසික මානව සොහොන් සහිත පුරාවිද්‍යාත්මක සාක්ෂි වන්නේ

1 රාවණා ඇල්ල 2 සීගිරිය 3 බෙලිලෙන
4 ඉබ්බන්කටුව 5 යාපනය (-----)

13 දේවානම්පියතිස්ස රජු විසින් ඉදිකළ ස්ථූපයක් වන්නේ

1 රුවන්වැලිසැය 2 ථූපාරාමය 3 අභයගිරිය
4 ජේතවනාරාමය 5 මිරිසවැටිය (-----)

14 ආර්ය සංක්‍රමණ වලට පෙර සිට මෙරට ස්වදේශික ජනයා විසූ ගමක් වන්නේ

1 අනුරාධගාම 2 මහාගාම 3 දීඝගාම
4 චන්දනාගාම 5 දොරමඩලාව (-----)

15 එළාර රජුට සහායවීමට ඉන්දියාවෙන් පැමිණි ආධාර හමුදාවේ නායකයාවූයේ

1 දීඝජන්තු 2 වේළුසුමන 3 භල්ලූක
4 ගෝඨාභය 5 පුලහත්ථ (-----)

16 වලගම්බා රජුට ආක්‍රමණිකයින්ගෙන් රට බේරා ගැනීමට සහය දැක්වූ භික්ෂූන්වහන්සේ කවුද?

1 මහානාම හිමි 2 මහා කාශ්‍යප හිමි 3 කුඩා තිස්ස හිමි
4 හබුගල්ලතිස්ස හිමි 5 කුපික්කලතිස්ස හිමි (-----)

17 ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරනුලැබුවේ

1 පොලොන්නරුව ගල් විහාරයේදී 2 මහාවාහාරයේදී
3 අභයගිරියේදී 4 මාතලේ අලූවිහාරයේදී
5 මාගම තිස්සවිහාරයේදී (-----)

18 ඉළනාග රජුට අවනතනොවූ ජනකොටස කුමක්ද?

1 මෝරිය වංශිකයින් 2 පාණ්ඩ්‍ය වංශිකයින් 3 ලම්බකර්ණ වංශිකයින්
4 මෞර්ය වංශිකයින් 5 කාලිංග වංශිකයින් (-----)

Learning Resource Center
R
De Mazenod College
Kandana

19 මෙරට භික්ෂුණී සාසනයට ඇතුලුවූ ප්‍රථම කාන්තාව වූයේ

1 සෝමා දේවිය 2 අනුලා දේවිය 3 විහාරමහා දේවිය

4 මහාමායා දේවිය 5 සිවලී කුමරිය (-----)

20 මෙරට පලමු රජ පෙලපතේ අවසාන පාලකයා වූයේ

1 සුභ 2 වසභ 3 පණ්ඩුකාභය

4 මහානාග 5 ගැමුණු (-----)

නොගැලපෙන පිළිතුර තෝරන්න

21 1 චෙකෝස්ලෝවැකියා 2 රෝමය 3 රුසියාව

4 පෝලන්තය 5 හන්ගේරියාව (-----)

22 1 පෙරික්ලීස් 2 සොලෝන් 3 සැක්සන්

4 ඩ්‍රැකෝ 5 ක්සෙලෙස්තිනස් (-----)

23 1 වොල්ගා 2 තේම්ස් 4 ටයිබර්

4 ඩැනියුබ් 5 ඩාඩනල්ස් (-----)

24 1 පැසිපික් 2 මධ්‍යධරණී 3 ආද්‍රියාන්තික්

4 බෝල්ටික් 5 ඊජියන් (-----)

25 1 ක්‍රීට 2 සිසිලි 3 සාර්ඩිනියා

4 ජාවා 5 එල්බා (-----)

**පහත සඳහන් ප්‍රශ්න සඳහා එක් මාතෘකාවක් යටතේ කරුණු පහක් දක්වා ඇත. ඒ අතරින් එක් කරුණක් මාතෘකාවට නොගැලපේ. එම කරුණ තෝරා ලියන්න**

**26** මහා ඇලෙක්සැන්ඩර්

1 ඉන්දියාව දක්වා සිය බලය ව්‍යාප්තකර ගත්තේය

2 මැසිඩෝනියානියෙකු විය

3 ග්‍රීක ලතින් සංස්කෘතිය ආසියාතික සංස්කෘතිය සමග සම්බන්ධවීමට මගසැලැස්විය

4 ප්ලේටෝගේ අධ්‍යාපන ආයතනයේ අධ්‍යාපනය ලබා ගත්තේය

5 ඇලෙක්සැන්ඩ්‍රියාව ගොඩනැංවිය (-----)

27 වැඩවසම් යුගය

1 කෘෂිකර්මය මත පදනම්වූ අර්ථක්‍රමයක් විය

2 පාලනය විකේන්ද්‍රගත විය

3 සමාජය අසමාන විය

4 නාගරික වෙළඳ සමාජයේ ඉහල පන්තිය විය

5 රාජ්‍ය ජාතික නැගී ඒම ආරම්භ විය (-----)

28 ග්‍රීක ආගම

1 බහු දේව වාදය පැවතුනි

2 ආගම මගින් ග්‍රීකයන්ගේ නිදහස් චින්තනය සීමා කලේය

3 ග්‍රීකයෝ දේව පරපුරක් පිළිබඳව විශ්වාස කළහ

4 පෞර රාජ්‍ය තුළ ආගමික එක්සත්බවක් විය

5 සියුස් ප්‍රධාන දෙවියා විය (-----)

29 රෝම අධිරාජ්‍යයේ බිඳවැටීම

1 ම්ලේච්ඡ ආක්‍රමණ

2 දුර්වල පාලකයින් බලයට ඒම

3 රෝම හමුදාව දුර්වල වීම

4 අධිරාජ්‍යයේ විශාලත්වය නිසා පාලනය දුර්වල වීම

5 කොන්ස්ටන්ටයින් අධිරාජ්‍යයා විසින් බටහිර රෝම අධිරාජ්‍යය ඇතිකිරීම (-----)

30 ප්‍රවේණිය

1 ස්වයංපෝෂිත විය

2 කෘෂිකර්මාන්තය ප්‍රධාන ජීවනෝපාය විය

3 වංශාධිපතියා ආරක්ෂාව සැපයීය

4 රජු අධිකරණ කටයුතු මෙහෙයවිය

5 ප්‍රවේණි දාසයින් ප්‍රවේණියේ පහළ මට්ටමේ සේවකයෝ වූහ (-----)

පහත ප්‍රශ්න වලට කෙටි පිළිතුරු ලියන්න

31 මහාවංසයේ පළමු කොටසේ කතුවරයා කවුද?

32 මෙරටට එල්ලවූ ප්‍රථම දකුණු ඉන්දියානු ආක්‍රමණය නම් කරන්න

33 සෘජු ප්‍රජාතන්ත්‍රවාදය බිහි වන්නේ කුමන පෞර රාජ්‍යය මුල්කොට ගෙනද?

34 ඔඩිසි නම්වූ වීරකාව්‍යය ලියූවේ කවුද?

35 .රෝම නීති සංග්‍රහය සකස් කිරීමට මුල්වූ අධිරාජ්‍යයා නම් කරන්න

36 ඇතිනා දෙවගන වෙනුවෙන් වෙන්වූ ග්‍රීක පෞර රාජ්‍යය නම් කරන්න

37 ඇතැන්ස් රාජයයේ ස්වර්ණමය යුගය ලෙස සැලකෙන්නේ කුමන පාලකයාගේ යුගයද?

38 රෝම අධිරාජ්‍යයට ආක්‍රමණ එල්ලකල ම්ලේච්ඡ ගෝත්‍රයක් නම් කරන්න ?

39 ග්‍රීකයින් ඇතිනා දෙවගන වෙනුවෙන් තැනූ සුප්‍රකට දේවාලය හැඳින්වූ නම කුමක්ද?

10 සුප්‍රසිද්ධ ග්‍රීක දාර්ශනිකයකු නම් කරන්න

28.11.2016 12 ශ්‍රේණිය
ඉතිහාසය
15

## II කොටස

පළමු ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න

1

1.පණ්ඩුකාභය රාජ්‍ය සමය මෙරට දේශපාලන ඉතිහාසයේ වැදගත් යුගයක් වීමට බලපෑ කරුණු දෙකක් ලියන්න

2.සෙල්ලිපි මගින් හඳුනාගත හැකි ඓතිහාසික කරුණු වඩාත් විශ්වාසනීය වීමට හේතු වන කරුණු දෙකක් ලියන්න

3.බුදු දහම පැමිණීමට පෙර මෙරට පැවති ආගම් පිළිබඳව තොරතුරු හෙළිවන අවස්ථා තුනක් ලියා දක්වන්න

4.ග්‍රීක පොර රාජ්‍ය වල දක්නට ලැබුණු දේශපාලන ලක්ෂණ දෙකක් හා සමාජීය ලක්ෂණ දෙකක් ලියන්න

ලකුණු 18

2. අ මෙරට ලියවුනු පැරණිතම වංසකතාව නම් කරන්න

ආ මහාවංසයේ කතුවරයා පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න

ඇ මහාවංසයේ සඳහන් වන කරුණු තහවුරු කර ගැනීමේදී සෙල්ලිපි වලින් ලැබෙන ආධාරය උදාහරණ සහිතව පැහැදිලි කරන්න

ලකුණු 14

3 දේවානම්පියතිස්ස යුගය මෙරට ඉතිහාසයේ වැදගත් කාලපරිච්ඡේදයක් වන්නේ මන්දැයි පහත සඳහන් තේමා ඔස්සේ පැහැදිලි කරන්න

දේශපාලන ක්ෂේත්‍රයේ ඇතිවූ වෙනස්කම්

සංස්කෘතික පුනර්ජීවනය

ලකුණු 14

4 "දුටුගැමුණු රජුට යුද්ධය සඳහා අවශ්‍ය පදනම සැපයුවේ කාවන්තිස්ස රජු විසිනි" මෙම ප්‍රකාශය කෙතෙක් දුරට සත්‍ය දැයි විවේචනාත්මකව විමසන්න

ලකුණු 14

5 වලගම්බා රාජ්‍ය සමයේ දේශපාලනික හා ආගමික වැදගත්කම පැහැදිලි කරන්න

ලකුණු 14

1 කුඩා ළතින් රාජ්‍යයක් ලෙස ආරම්භවූ රෝම නගරය විශාල අධිරාජ්‍යයක් දක්වා වර්ධනය වූ ආකාරය පැහැදිලි කරන්න

2. රෝමවරුන් ලොවට දායාද කළ ගෘහ නිර්මාණ ශිල්පය පිළිබඳව පැහැදිලි කරන්න

7. මධ්‍යත

8 කෑමති

1. ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම

2. ග්‍රීක දාර්ශනිකයෝ

3. ග්‍රීක සාහිත්‍යය.

4. වාඩවයම් යුගයේ ආගම

Learning Resource Center
R
De Mazenod College
Kandana